බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව

හෙලමුදුන, බණ්ඩාරවෙල

0572222517

bawelaprasa@gmail.com

www.bandarawelaps.gov.lk

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ හා යුරෝපා සංගමයේ අනුග්‍රහයෙනි.

Funded by European Union

UNDP

STRIDE | CDLG Capacity Development of Local Governments

## බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව

# ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අවසර ඉල්ලා සිටීමේ දී ඔබ ක්‍රියා කළ යුතු ආකාරය.

www.bandarawelaps.gov.lk

## ඉදිරිපත් කළ යුතු ලේඛන

- පෙරටු කාර්යාලයෙන් හෝ අන්තර්ජාලයෙන් ලබා ගෙන නිවැරදිව සම්පූර්ණ කළ ඉල්ලුම් පත්‍රය;
- A 4 ප්‍රමාණයේ කඩදාසියක මුද්‍රණය කරන ලද හෝ අතින් අඳින ලද (යොදා ගන්නා වර්ණ ද පෙන්නුම් කරන), ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන ප්‍රචාරක දැන්වීමෙහි සමරූපී ආදර්ශයක්;
- කිසියම් මාර්ගයක රක්ෂිතයක සවි කර ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් පුවරුවක් වන විට, අදාළ වන පරිදි ඒ මාර්ගයේ අයිතිය ඇති මාර්ග සංවර්ධන අධිකාරිය හෝ පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරිය හෝ සභාව විසින් ඒ සඳහා අවසර දුන් ලිපියේ මුල් පිටපත;
- කිසියම් මාර්ගයක රක්ෂිතයක සවි කර ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් පුවරුවක් වන විට, අදාළ ප්‍රචාරක දැන්වීම් පුවරුව ප්‍රදර්ශනය කරන ස්ථානය අයත් වන පොලිස් ස්ථානයේ රථ වාහන අංශයේ ප්‍රධානියා විසින් නිකුත් කළ ලිපියේ මුල් පිටපත;
- ඉල්ලුම්කරු ඉඩමේ අයිතිකරු නොවන විට සහ කිසියම් ඉඩමක හෝ ගොඩනැගිල්ලක සවි කරනු ලබන හෝ ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීමක් වන විට, ඒ ඉඩමේ හෝ ගොඩනැගිල්ලේ අයිතිකරු හෝ අයිතිකරුවන් විසින් ඒ සඳහා ඉඩ දීමට කැමැත්ත ප්‍රකාශිත ලිපියේ පිටපතක්;
- 2021 නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝගවල 104 වන නියෝගය යටතේ නාගරික සංවර්ධන අධිකාරිය විසින් හෝ සභාව විසින් අනුමත කළ බලපත්‍රයේ සහතික කළ පිටපත.

## ගෙවිය යුතු ගාස්තු:

- ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාවට අනුව දැන්වීමේ වර්ග ඵලය මත ගෙවිය යුතු ගාස්තුව (දැන්වීමේ වර්ග ඵලය පරීක්ෂා කර බැලීමෙන් පසුව ගාස්තු ප්‍රමාණය දැනුම් දෙනු ඇත);
- බලපත්‍ර ගාස්තුවට සරිලන රජය නියම කළ බදු.

## කාර්යයට සම්බන්ධ වන නිලධාරීන්

පෙරටු කාර්යාල නිලධාරියා:

දුරකථන අංකය: 0572222517

විද්‍යුත් තැපෑල: bawelaprasa@gmail.com

ආදායම් පරීක්ෂක:

දුරකථන අංකය: 0572222517

විද්‍යුත් තැපෑල: bawelaprasa@gmail.com

## ඔබගේ කාර්යය නිම කිරීමට අපට අවශ්‍ය කාලය: දින 15

## විශේෂ කරුණු:

- දැන්වීම ප්‍රදර්ශනය කිරීමට අවසර දී ඇති කාලය අවසන් වීමෙන් පසු, එම දැන්වීම ගලවා ඉවත් කිරීමට ක්‍රියා කළ යුතු ය;
- ප්‍රචාරක දැන්වීමෙන් හෝ එහි යම් කොටසකින්, යම් තැනැත්තකුට හෝ දේපළකට සිදු වන හානි සම්බන්ධයෙන් ඉල්ලුම්කරු වගකිව යුතු ය.